BOI
SRI LANKA

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## කටුනායක අපනයන සැකසුම් කලාපය

## (මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

### භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ / ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

### කොන්ත්‍රාත් අංකය::BOI/KEPZ/ZM/2025/02

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කටුනායක අපනයන සැකසුම් කලාපයේ ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් හේතුවෙන් ඉවත් කරන ලද කාණ්ඩ (Lot) 29ක් යටතේ වර්ග කර ඇති භාණ්ඩ / ද්‍රව්‍ය විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

මිල ගණන් කැඳවීම සඳහා ඉදිරිපත් කර ඇති භාණ්ඩ/ද්‍රව්‍ය පහත සඳහන් වර්ගයන්ට අයත් වේ.

| | |
|---|---|
| 01. වීදුරු | 02. කටු කම්බි, ආරක්ෂිත දැල් |
| 03. ඇලුමිනියම් කොටස් | 04. මලනොබැඳෙන යකඩ |
| 05. දොරවල් (යකඩ, ඇලුමිනියම්, ප්ලයි වුඩ්, ප්ලාස්ටික් ) | 06. ජල නල උපාංග - වාත්තු යකඩ නළ. පි.වී.සි නල |
| 07. නාන කාමර උපාංග - සෙරමික් අයිතම | 08. ජල පෙරනයන් (මෝටරයන් සමග) |
| 09. බෝ(ර්)ඩ් - (යකඩ, ඇලුමිනියම්, ප්ලයි වුඩ්) | 10. දැව (උළුවහු , ජනෙල්, වහල සෙවිලි කොටස්) |
| 11. අමානෝ ශීට් | 12. යකඩ උපකරණ හා කොටස් |
| 13. විදුලි උපාංග කොටස් | 14. පුටු සහ මේස |
| 15. මුලුතැන්ගෙයි උපකරණ | 16. ගැල්වනයිස් තහඩු |

ඉහත සඳහන් භාණ්ඩ/ද්‍රව්‍ය පරීක්ෂා කිරීම **2025.09.22** දින සිට **2025.10.10** දින දක්වා සාමාන්‍ය කාර්යාල දිනයන්හිදී **පෙ.ව 9.00 සිට ප.ව 3.00** අතර කාලය දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කටුනායක අපනයන සැකසුම් කලාපයේ අදියර 1හිදී සිදු කල හැකිය. මේ සම්බන්ධව වැඩිවිස්තර දුරකථන අංක **011-2251855** ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කලාප කළමනාකරණ) ඇමතීමෙන් ලබාගත හැකිය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කටුනායක අපනයන සැකසුම් කලාපයේ මුදල් දෙපාර්තමේන්තුව වෙත නැවත නොගෙවන **රු. 1500/- +2.5% සමාජ ආරක්ෂණ බද්ද +18% වැට් බදු** ගාස්තුවක් ගෙවා ලබා ගත් ලදු පත සමග ලිඛිත ඉල්ලීමක් කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අදාල ප්‍රසම්පාදන ලියකියවිලි **2025.09.22** දින සිට **2025.10.13** දක්වා සාමාන්‍ය කාර්යාල දිනයන්හිදී **පෙ.ව 9.00** සිට **ප.ව 3.00** අතර කාලය තුලදී ලබාගත හැක .

ප්‍රසම්පාදන අයදුම් පත් සහ භාණ්ඩ/ද්‍රව්‍ය පරික්ෂා කිරීමට කලාපයට ඇතුල් වීම සඳහා ප්‍රසම්පාදන කැඳවීම් නිවේදනයේ පිටපතක් සමග ජාතික හැඳුනුම්පත ආරක්ෂක අංශය වෙත ඉදිරිපත් කල යුතු වේ.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් මුද්‍රා තබා **2025.10.14** දින **ප.ව 2.30ට පෙර** ලැබෙන සේ සභාපති ප්‍රසම්පාදන මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂක (කලාප කළමනාකරණ) බාරේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අපනයන සැකසුම් කලාපය, කටුනායක යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ පැමිණ කටුනායක, ප්ලාසා ගොඩනැගිලි යුනිට් 05හි පිහිටි මුදල් දෙපාර්තමේන්තුවේ ඇති ප්‍රසම්පාදන පෙට්ටිය තුලට බහාලිය හැක.

අදාල ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ **"භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ / ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් කැඳවීම"** යනුවෙන් සඳහන් කළයුතු වේ.

සභාපති
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**